නාලන්දා විද්‍යාලය - කොළඹ 10

අනාවරණ පරීක්ෂණ

11 ශ්‍රේණිය | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** | **02 ඒකකය**

- **වඩාත් සුදුසු ම පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) පහත සඳහන් ඒවායින් පද්ධති ජීවන චක්‍රෙය් පියවරක් නොවන්නේ,

I. පද්ධතිය පිහිටුවීම (Deployment of the system)
II. පද්ධති නඩත්තු කිරීම (Maintenance of the system.)
III. පද්ධති වර්ගීකරණය (Classification of the system)
IV. විසඳුම් සැලසුම් කිරීම (Designing the solution)

02) තොරතුරු පද්ධති සම්බන්ධයෙන් පහත ප්‍රකාශන සලකන්න.

A. නව පද්ධති නිර්මාණය හෝ පවතින පද්ධති සංවර්ධනය සඳහා SDLC භාවිත කරයි.
B. ආදානය, සැකසීම සහ ප්‍රතිදානය ඕනෑම පද්ධතියක අඩංගු මූලිකාංග වේ.
C. තීරු කේත කියවනය මගින් දත්ත සමුදාය පාලනය කිරීම අත්‌යුරු තොරතුරු පද්ධතියක වාසියක් වේ.

ඉහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය හෝ ප්‍රකාශ වන්නේ

I. A පමණි II.A සහ B පමණි III. B සහ C පමණි IV.සියල්ල

03) පද්ධති සංවර්ධන ජීවන චක්‍රය ආරම්භක අවධියේ දී පරිශීලකයින් සමඟ සාකච්ඡා කරමින් තොරතුරු එක්රැස් කරමින්, පද්ධති ලේඛන ගතකමින් සහ විසඳුම් යොජනා කරමින් ..... තම කාලනේ වැඩි කොටසක් වැය කරයි.මෙහි හිස්තැනට සුදුසු වන්නේ,

I. පද්ධති නිර්මාණකරු (System designer) II. ක්‍රමලේඛක (Programmer)
II. පද්ධති විශ්ලේෂක (System analysts) IV. පද්ධති අයිතිකරු (System Owner)

- **සුදුසු පිළිතුර ලියා දක්වන්න.**

1) පද්ධතියක් යනු කුමක්ද?

2) පද්ධතියක මූලික සංඝටක කවරේද?

3) අත්‌යුරු පද්ධතියක සහ පරිගණක පාදක තොරතුරු පද්ධතියක් අතර ප්‍රධාන වෙනස්කම් ලියා දක්වන්න.

4) පාසල් පද්ධතියක් සළකමින් පද්ධතියක මූලික කොටස් පැහැදිලි කරන්න.

5) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පියවරයන් ලියා දක්වන්න.

6) පද්ධති සංවර්ධනයේ දී තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේද ලියාදක්වන්න.

7) **"විසඳුම් පරීක්ෂා කිරීම"** පැහැදිලි කරන්න.

8) **"පද්ධතිය පිහිටුවීම"** පැහැදිලි කරන්න.

9) පද්ධතියක් සඳහා පද්ධති නඩත්තු කිරීමක් අවශ්‍යය වන්නේ ඇයි?

10) විවිධාකාර වූ පද්ධති සංවර්ධන ආකෘති දැකිය හැක. ඒවා ලියා දක්වන්න.